## 2019 ජූලි මස 01 වන දින සිට 2019 ජූලි මස 06 වන දින දක්වා
## ප්‍රශංසා එකතු සුපුවත
**"අබ්බා තාත්තේ ! ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා !"**

01. ප්‍රශංසාව සඳහා :

අපි දාසයන් නොවෙමු. මන්ද තම පුත්‍රයාණන් මගින් මහෝත්තමයාණන් දාසකමේ වියගහෙන් අප මුදා ගත් සේක. එහෙයින් අපි ඔවුන් වහන්සේගේ ප්‍රසන්න දරුවන් වෙමු. තවද ශුද්ධාත්මයාණන් කරණ කොට ගෙන අබ්බා පියාණෙනි කියා යාච්ඤා කරන්නට ද. ඔවුන් වහන්සේ අභියස නිරතුරුවම සිටිමින් රාජ්‍ය වෙනුවෙන් සේවය කරන්නට ද, සුදුස්සන් වශයෙන් අප සැලකීම ගැන මේ මොහොතේ තුති පුදමු.

පුබුදු ගී 150 "ඔබෙන් තොරව...."

යාච්ඤාව තුළ මෙනෙහි කිරීම සඳහා :

රෝම 8:15 **" මන්ද ඔබ ලබා ඇත්තේ නැවතත් බිය ගෙන දෙන වහල් සේවයේ තත්ත්වය නොව, 'අබ්බා පියාණෙනි' යි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රකම ලැබීමේ තත්ත්වයකි."** (රෝම 8:15)

02. පසුගිය සතියේ සුපුවත නැවතත් මෙනෙහි කරමින්, අත්දැකීම් බෙදා ගැනීම.

03. සතියේ සුපුවත :

* මාගේ පියාණන් වහන්සේ ඔබගේ පියාණන් වහන්සේයි. ඔවුන් වහන්සේ ඔබට නොනැවතී ප්‍රේම කරන සේක යන විශ්වීය සත්‍යතාවය ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක. එපමණක් නොව ස්වර්ගීය පියාණන් වහන්සේ සර්ව සම්පූර්ණව සිටින්නාක් මෙන්, ඔබද සම්පූර්ණව සිටින්නැ'යි තම ශ්‍රාවකයින්ට මෙන්ම තෝරා ගත් ජනතාවට පළමු කොට ඇරයුම් කළ සේක. ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිත පැවැත්මෙන් ශුද්ධවූ දෙවියන් වහන්සේ අබ්බා තාත්තා බවට ජීවිත පැවැත්ම මගින් තහවුරු කළ සේක.

* අපි දැන් දේව පුත්‍රයාණන් දෙස බලමු. පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨ කියවා අබ්බා පියාණන් කෙරෙහි තිබූ ප්‍රේමය කෙතරම්දැයි කියා සාකච්ඡා කරමින් බෙදා ගනිමු.

i ශු.ජොහාන් 12:27-28 **"දැන් මාගේ සිත කැළඹී ඇත; ඉදින් මම කුමක් කියම් ද? නැත.... පියාණෙනි, ඔබගේ නාමය මහිමයට පැමිණවුව මැනව යි වදාළ සේක."**

ii ශු.ජොහාන් 12:49-50 **" මන්ද, මම මාගේම අධිකාරි බලයෙන් කථා නොකෙළෙමි; මා එවා වදාළ පියාණන් වහන්සේ මා කිව යුතු දෙයත්, දෙසිය යුතු දෙයත් ගැන මට ආඥාවක් දී තිබේ. ..."**

iii ශු.ජොහාන් 13:1 **" තමන් මෙලොවින් ඉකුත්ව පියාණන් වෙතට යාමේ නියමිත මොහොත පැමිණ තිබෙන බව පාස්කු මංගල්‍යයට පෙර, ජේසුස් වහන්සේ දැන ගත් සේක. "**

04. වැඩිදුරටත් මෙනෙහි කිරීම සඳහා :

* සැබවින්ම ශුද්ධවූ දෙවියන් වහන්සේ පියෙකු මෙන් මිනිසා මැවූදා පටන් ප්‍රේම කළ සේක. නොනැවතී සදාකාල ප්‍රේමයකින් ප්‍රේම කරන සේක.

* ශුද්ධ ලියවිල්ල ඊට මනාව සාක්ෂි දරයි. පැරණි ගිවිසුම තුළ ආදම් නමැති මිනිසාව සොයා ගෙන පැමිණි අබ්බා තාත්තා සදාකාල ප්‍රේමයේ ගිවිසුමට මුල පිරූ සේක. පියෙකු තම පුත්‍රයාට ආදරය, සෙනෙහස පාන්නට ප්‍රේමය තුළින් නික්මෙන සකල ආශිර්වාදය දෙන්නටත්, හදවතේ ප්‍රේමය ප්‍රකාශ කරන්නටත් පුත්‍රයෙකු මෙන් ආබ්‍රහම් කැඳවූ සේක.

* මෝසෙස් හුදකලාවේ තමන්ගේ පාඩුවේ සිටි මිනිසෙකි. සමිඳාණන් ඔහුගේ දුබලකම් කිසිවක් ගැන නොබලා, නොසිතා ඔහු කැඳවූයේ තම දරුවන් වෙත දයාව, කරුණාව දැක්වීමටයි. ඊශ්‍රායෙල් සෙනඟ ඔවුන් වහන්සේට තමන්ගේම පුත්‍රයා විය. පාපිෂ්ඨ, දුබල මිනිසෙකු වූ මෝසෙස් සමඟ සංවාද කරන්නට තරම්, තම සිතැඟියාවක් බෙදා ගන්නට තරම් ඔහුට සමීප වූ සේක. ඔහු තුළින් පියෙකු මෙන් ජනතාවට ද ඉමහත් සේ ප්‍රේම කළ සේක.

* අවසාන යුගයේ තම පුත්‍රයාණන් අප වෙත එවන ලද්දේ... මුළු මිනිස් සංහතියටම දක්වන අසීමිත වූ ප්‍රේමය එළිදරව් කරමිනි. දේව පුත්‍රභාවයේ උරුමය අපටද උරුම කර දීම අබ්බා පියාණන්ගේ කැමැත්ත විය.

* "මම මේ දේව නියෝගය ප්‍රකාශ කරන්නෙමි. එතුමාණෝ කථා කොට, 'නුඹ මාගේ පුත් කුමරුය. අද මම ඔබේ පිය රජු වූයෙමි. නුඹ කැමති දෙයක් මාගෙන් අයදින්න. සකල ජාතීන් නුඹේ උරුමය වන්නෝ ය...."

05. සතිය පුරා ප්‍රායෝගික වීම සඳහා:
  * දවස පුරා, සතිය පුරා ජීවිත අත්දැකීම් තුළින් ක්‍රිස්තුන් වහන්සේ මගින් අබ්බා තාත්තා අභිමුව රැඳී සිටිමු.
  * එමගින් අප වෙත ගලා එන පිතෘක ප්‍රේමය හඳුනා ගනිමින් ඊට සාක්ෂි දරමු.

06. අවසාන ප්‍රශංසාව :
  * පිතෘක ආදරය අත්දැකීමේ හා අවබෝධ කර ගැනීමේ අනුග්‍රහය ඉල්ලා යාච්ඤා කරමු.
  * ශුද්ධාත්ම ගීයක් ගායනා කරමු.

==============================

**2019 ජූලි මස 08 වන දින සිට 2019 ජූලි මස 14 වන දින දක්වා**
**ප්‍රශංසා එකතු සුපුවත**
**අබ්බා අම්මේ ! කියා ඔබ අමතන්නට වරම් ලැබූ අපි භාග්‍යවන්තයන් වෙමු**

01. ප්‍රශංසාව සඳහා :
  * මිනිස් මවකගේ ගර්භය තුළ දරුවෙක් පෝෂණය වන්නා සේ ගැඹුරු සුරක්ෂිතභාවයක් අත්විඳින්නා සේ අපිදු අබ්බා අම්මාගේ ගර්භය තුළ මාතෘක ප්‍රේමයෙන් පෝෂණය වෙමින්, වර්ධනය වෙමින් පූර්ණ වන්නෙමු.
  * ත්‍රිවිධ සතුරන් මෙන්ම ලෝකය තුළ අපට විවිධ අනතුරු ආපදාවන් තිබේ. අනේකාකාර පීඩාද, සතුරු උවදුරු ද ඇත. එහෙත් අපි අබ්බා මෑණියන් තුළ සුරක්ෂිත දරුවන් වෙමු. මන්ද, මාතෘක ආදරය අපව සුරක්ෂිත කරනු ලබයි. මේ දිව්‍යමය සිහිනය අපි අයිති කර ගනිමු.
  * පුබුදු ගී 146 "අභිරහසක් කර දා ..."

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමින් ප්‍රේමයේ සාක්ෂිකරුවන් වෙමු.

03. සතියේ සුපුවත :
  * දරුවෙක් අම්මේ කියා අමතන විට, මොරගසන විට, තම දරුවාගේ කටහඬ ඇසෙද්දීම ආදරණීය මවක් තුළින්, ඇගේ හදවත තුළින් සෙනෙහසක්, ආදරයක් නික්මෙන බව නොරහසකි. එසේ නම් අපි සියල්ලෝම අබ්බා අම්මාගේ ගර්භය තුළ රැඳෙන බවට නිතරම අවදියෙන් සිටිමු. එසේම දේව ගර්භය තුළ සිටින අප අබ්බා අම්මේ කියා අමතන විටදී, මොරගසන විටදී මහෝත්තමයාණන් වෙතින් නික්මවෙන මාතෘක ආදරය අප වෙත ගලා එන බව අයිති කර ගනිමු. මාතෘක සෙනෙහස භුක්ති විඳිමු.
  * පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ කියවා දෙවියන් වහන්සේගේ ආදරය තුළින් ප්‍රකාශ වෙන මාතෘක ප්‍රේමය අපගේ ජීවිතවලට බද්ධ වන්නේ කෙසේදැයි හඳුනා ගෙන බෙදා ගන්න.

i උත්පත්ති 1:27 **"දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක;**
**දෙවියන් වහන්සේගේ ම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක.**
**පුරුෂයා ද ස්ත්‍රිය ද වශයෙන් ඔවුන් මැවූ සේක."**

ii පේරමියා 1:5 **" මා නුඹ කුසෙහි පිළිසිඳගැනීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි. නුඹේ උපතට පෙර, මම නුඹ කැප කළෙමි. ..."**

04. වැඩි දුරටත් මෙනෙහි කිරීම සඳහා :
  * ප්‍රේමය නිසාම මවන ලද මිනිසා සමඟ මැවීමේදීම මැවුම්කරුවාණන් පිතෘක මාතෘක ප්‍රේමය බෙදා ගන්නා ලදී. මිනිසා යනු ස්ත්‍රිය සහ පුරුෂයා ය. එසේ නම් දිව්‍යමය ප්‍රේමය යනු පිතෘක ප්‍රේමය මෙන්ම මාතෘක ප්‍රේමය ද බව මිනිසා මැවීමේදීම අපට අනාවරණය කරයි.
  * අප දේව ගර්භය තුළ සිටිනවා යන්නෙන් අදහස් කරන්නේ අපි සියල්ලෝම මාතෘක ප්‍රේමය තුළ රැඳෙන බවයි. ඉන් පෝෂණය වන බවයි. දෙවියන් වහන්සේ සුවිශුද්ධය. එබැවින් ඔවුන් වහන්සේ අපට ඉතාම දුරස්ථර මෙන්ම ඉතා සමීපය. තම දරුවාට ආදරය කරන මවක් මෙන් සමිඳාණන් වහන්සේගේ ප්‍රේමය විටෙක අප සනසන්නේ මවක මෙනි. ඔවුන් වහන්සේද අප හා ප්‍රීති වන සේක. දුක් පීඩාවලදී අප සනසමින් අපගේ හදවතේ කඳුළු පිස දමන සේක. අප හොඳින් රැකබලා ගන්නා සේක. මෙය අදහස් ස්වල්පයක් හෝ වචන ස්වල්පයක් නොව <u>**සැබෑම බව**</u> අත්දකිමු.

ක්‍රියා 17:28 **"අපි ඔවුන් වහන්සේ තුළ ජීවත් වෙමු, හැසිරෙමු, පවතිමු. අපි ඔවුන් වහන්සේගේ දරුවෝ වෙමු."**

05. සතිය පුරා ප්‍රායෝගික වීම සඳහා:
- * ජීවිත සිද්ධීන් වලදී ශුද්ධ ලියවිල්ල දිනපතා මෙනෙහි කරන විටදී එහි අන්තර්ගත මාතෘක ආදරය හඳුනා ගන්න.
- * වැඩි වැඩියෙන් අබ්බා අම්මාගේ ආදරය. සෙනෙහස, දයාව කොතරම්දැයි හඳුනා ගෙන අත්දකින තරමට අප හදවත් මාතෘක ආදරයෙන් පිරී යන්නාසේම අප තුලින් අන් අය වෙත ගලා යන බවද සිහිපත් කර ගන්න.
- * පුද්ගලයා, පවුල, සංඝය හා සමාජය තුළ අන් අය වෙත අප අත්දකින ප්‍රේමය ප්‍රායෝගික කරමු.
- * ශුද්ධවූ දෙවියන් වහන්සේ අපගේ අම්මා බවද සාක්ෂි දරමු. එමගින් මහෝත්තමයාණන්ව මහිමයට පත් කරමු. ඔවුන් වහන්සේගේ කැමැත්ත ඉටු කරමු.

06. අවසාන යැදුම :
- * අබ්බා අම්මේ කියා අමතන්නට වරම් ලද අප, ප්‍රායෝගික ජීවිතය තුළ මවකගේ ප්‍රේමය අත්දකින්නට බලය පතා යදිමු.
- * පුබුදු ගී අංක 158 "මවකට හැකිවෙද ...."

***************************